# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1896/22 - 2015 ජනවාරි මස 07 වැනි බදාදා - 2015.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(x).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක පීවී 66705 දරන ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරනු ලැබූ සීමාසහිත කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම (KAATSU - Highly Advanced Medical Technology Training centre (pvt) Ltd) (KIU) සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, සහ මෙහි I වන උපලේඛණයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙහි II වන උපලේඛණයේ II තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුම් සහිතව මෙහි II වන උපලේඛණයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපාධි ප්‍රදානය කිරීමට සිදුකරනු ලබන, උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් සීමාසහිත කාට්සු - හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම මෙම නියමය මගින් පිළිගෙන සිටිමි.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලබා දුන් දින සිට මාස දෙකක් ඉකුත්වීමට පෙරාතුව (මින් මතු "ආයතනය" ලෙස හැඳින්වෙන) සීමාසහිත කාට්සු - හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම විසින් නිසි අධිකාරිය වෙත පහත සඳහන් පරිදි යථා පරිදි සංශෝධිත ස්වකීය සාංගමික ව්‍යවස්ථාව භාර දිය යුතුය :- එනම්

(*අ*) සාංගමික ව්‍යවස්ථාවේ අරමුණක් වශයෙන් උසස් අධ්‍යාපනය විෂය නිශ්චිතව දැක්වීම ;

(*ආ*) එම වසා දැමීමට පෙරාතුව සමාගම ස්වෙච්ඡාවෙන් වසා දැමීම පිළිබඳ නිශ්චිත අධිකාරිය වෙත දැනුම් දීම සඳහා භාර ගැනීම.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. ආයතනය විසින් උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ප්‍රදානය කිරීමේ දින සිට මාස හයක් අවසන් වීමට පෙරාතුව නිශ්චිත අධිකාරිය වෙත පහත දැක්වෙන විස්තර ලබා දිය යුතුය :-

(i) අදාල උපාධි වැඩසටහන සඳහා වූ අවශ්‍යතා සපුරාලන පරිදි සුදුසුකම්ලත් අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම පිළිබඳ සාධකයන් ;

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ක්‍රමවේද ප්‍රකාරව අධ්‍යයන කාලසීමාව සඳහා වූ අධ්‍යයන වැඩ සටහනක් ;

(iii) අදාළ උපාධි වැඩසටහන සඳහා නියමිත සිසුන්, පොත්, අත්පොත්, නිර්දේශිත කියවීම් පොත් හා වෙනත් ප්‍රමාණවත් අධ්‍යයන ද්‍රව්‍ය පිළිබඳ සාධකයක් ;

(iv) මනා පහසුකම් සහිත පුස්තකාලයක් පැවතීම ;

(v) කටුචිකිත්සක උපාධි වැඩසටහනේ විද්‍යා (ගෞරව) උපාධිය සම්බන්ධයෙන් :-

(අ) සායනික පුහුණුව සඳහා පහට එක අනුපාතිකය යටතේ නියම කරන ලද ප්‍රමාණවත් ඇඳන් සංඛ්‍යාවක් ඇති බවට සාධකයන් ;

(ආ) කටුචිකිත්සක වේදය පිළිබඳ නිර්දේශිත මුද්‍රිත පොත්පත් ඇති බවට සාධකයන්.

3. හෙද විද්‍යා (ගෞරව) උපාධි වැඩසටහන සඳහා දැනට පුහුණුවේ යෙදී සිටින ලියාපදිංචි හෙදියන් පමණක් ආයතනය විසින් බඳවා ගනු ලැබිය යුතුය.

## II උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධි වැඩසටහන්* | *II වන තීරය*<br>*උපාධි සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| KAATSU- වෛද්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය | බී.එස්.සී. (ගෞරව) (වෛද්‍ය විද්‍යාවේදී) කාට්සු |
| කටුචිකිත්සක විද්‍යාව පිළිබඳ වෛද්‍ය විද්‍යා ගෞරව උපාධිය | බී.එස්.සී. (ගෞරව) කටුචිකිත්සක |
| හෙද වෛද්‍ය විද්‍යා ගෞරව උපාධිය | බී.එස්.සී. (ගෞරව) (හෙද) |

මෙම නියමයේ "නිශ්චිත අධිකාරිය" යන්නෙන් උසස් අධ්‍යාපන විෂය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2015 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

01 - 641

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.